# 3 පෘතුගීසීන් ශ්‍රී ලංකාවට පැමිණීම

ඉන්දියන් සාගරයේ පිහිටි සරුසාර, සුන්දර දිවයිනක් වූ ශ්‍රී ලංකාව ඈත අතීතයේ සිට ම නිරන්තරයෙන් විදේශීන්ගේ අවධානයට පාත්‍ර විය. ඒ අනුව 16 වන සියවසට පෙර වැඩි වශයෙන් පෙරදිග ජාතීන් ද 16 වන සියවසට පසු බටහිර ජාතීන් ද ශ්‍රී ලංකාව කෙරෙහි තම අවධානය යොමු කර තිබිණි. අපරදිග ජාතීන් පෙරදිගට පැමිණීමට හේතු වූ සාධක, ශ්‍රී ලංකාවට පැමිණි පෘතුගීසීන් ක්‍රියාත්මක කළ වැඩ පිළිවෙළ, ඔවුන් ශ්‍රී ලංකා සමාජය තුළ ඇති කළ විවිධ බලපෑම් ආදිය පිළිබඳ ව මෙතැන් සිට අධ්‍යයනය කරමු.

## ★ පෙරදිගට පැමිණි යුරෝපා ජාතීන්

| මව් රට | ජාතිය | පෙරදිග මධ්‍යස්ථානය |
|---|---|---|
| පෘතුගාලය | පෘතුගීසීන් | ගෝව |
| ඕලන්දය | ලන්දේසීන් | බතාවිය |
| ප්‍රංශය | ප්‍රංශ ජාතිකයන් | පොන්ඩිචෙරි |
| බ්‍රිතාන්‍යය | ඉංග්‍රීසීන් | කල්කටා/මදුරාසි/ බොම්බාය |

මුස්ලිම් වෙළෙන්දෝ ඉතා ඈත අතීතයේ පටන් පෙරදිග රටවල සිට විවිධ වෙළෙඳ ද්‍රව්‍ය යුරෝපයට ගෙන ගියහ. යුරෝපා ජාතිහු එම වෙළෙඳ ද්‍රව්‍ය අතරමැදි මුස්ලිම් වෙළෙඳුන්ගෙන් ලබා ගත්තා මිස පෙරදිගට පැමිණ ඒවා ලබා ගැනීමට උනන්දු නො වූහ. මුස්ලිම්වරුන් පෙරදිග සිට, ගෙන ගිය වෙළෙඳ ද්‍රව්‍ය යුරෝපා ජාතීන්ට අලෙවි කළ ප්‍රධාන වෙළෙඳ මධ්‍යස්ථානය වූයේ කොන්ස්තන්තිනෝපල් නගරය යි.

| වෙළෙඳ ද්‍රව්‍ය ලබාගත් රටවල් | ගෙන ගිය වෙළෙඳ ද්‍රව්‍ය |
|---|---|
| ★ නැඟෙනහිර ඉන්දීය දූපත් | කරඳමුංගු, කරාබුනැටි, සාදික්කා |
| ★ ඉන්දියාව | ගම්මිරිස්, ඉඟුරු, අබිං, රෙදි, සහල්, දියමන්ති, පදම් කළ හම්, කපු |
| ★ චීනය | පටපිළී, රන්, කස්තුරි, තේ |
| ★ ජපානය | රිදී |
| ★ ශ්‍රී ලංකාව | කුරුඳු, පුවක්, මුතු, මැණික්, ඇත් දළ, ඇතුන් |

පෙර--අපර දෙදිග වෙළෙඳ කටයුතු පවත්වා ගත් ප්‍රධාන වෙළෙඳ මාර්ග දෙවන පාඩමේ දී සිතියමක දක්වා ඇත. ඉතිහාසය I කොටස 43 පිටුවේ දක්වා ඇති එම සිතියම හොඳින් අධ්‍යයනය කරන්න.

## යුරෝපා ජාතීන් පෙරදිගට පැමිණීමට බලපෑ හේතු

- ★ ක්‍රිස්තු භක්තිකයන් හා මුස්ලිම්වරුන් අතර දිගු කාලීන ව පැවති කුරුස යුද්ධ මුස්ලිම්වරුන්ට ජය අත් කොට දෙමින් ක්‍රි.ව. 1453 අවසන් විය. යුද්ධය අවසානයේ කොන්ස්තන්තිනෝපලය අත්පත් කර ගත් මුස්ලිම්වරු යුරෝපීයයන්ට වෙළෙඳ ද්‍රව්‍ය ලබා දීමේ දී විවිධ බාධා ඇති කළහ. ඒ අනුව වෙළෙඳ ද්‍රව්‍ය අලෙවියෙන් අධික ලාභ ලැබීම, නිතර නිතර භාණ්ඩ මිල ඉහළ දැමීම, කලට වේලාවට භාණ්ඩ ලබා නොදීම, අධික තීරු බදු අය කිරීම ආදිය මගින් කරන ලද බලපෑම්, බටහිර ජාතීන් මහත් අසීරු තත්ත්වයන්ට පත් කිරීමට හේතු විය. එම දුෂ්කරතා ජය ගැනීම සඳහා අතරමැදි වෙළෙඳුන් මඟහැර තුමූ ම පෙරදිගට පැමිණ වෙළෙඳ භාණ්ඩ මිල දී ගැනීමට යුරෝපා ජාතීන්ට අවශ්‍ය විය.
- ★ පෙරදිග වෙළෙඳ කටයුතු මගින් ලබා ගත් ආර්ථික ශක්තිය ඔටෝමන් තුර්කිවරුන්ට කුරුස යුද්ධ ජය ගැනීමට උපකාරී වූ බව වටහා ගත් යුරෝපා ජාතීහු, පෙරදිගට ගොස් මුස්ලිම්වරුන් පරාජය කොට, ඔවුන්ගේ වෙළෙඳ ඒකාධිකාරය බිඳ දැමීමට ද එම වෙළෙඳ ඒකාධිකාරය තමන් සතු කර ගැනීමට ද බලාපොරොත්තු වූහ.

## පෘතුගීසීන් පෙරදිගට පැමිණීම

අප්‍රිකාව වටා යාත්‍රා කොට ඉන්දියාවට පැමිණිය හැකි මාර්ගයක් සොයා ගතහොත් මුස්ලිම්වරුන් සතු ව ඇති වෙළෙඳාම තමන්ට අත්පත් කොට ගත හැකි බව පෘතුගීසීහු දැන සිටියහ. එරට රජවරු තම බලාපොරොත්තුව ඉටු කර ගැනීම සඳහා පෘතුගාල වැසියන් පෙලඹවූ අතර නාවික ගමන් සඳහා අවශ්‍ය ආධාර උපකාර ද ලබා දුන්හ. පෘතුගාලයේ ලිස්බන් වරාය අත්ලන්තික් සාගරයට මුහුණ ලා පිහිටි අගනා වරායයක් වීම ද ජනතාව නොබියව සාගර ගමන් සඳහා යොමු කරවීමට හේතු විය. නාවුක ගමන් සඳහා පර්යේෂණ කිරීම නිසා ම නාවුක හෙන්රි නමින් ප්‍රසිද්ධියට පත් වූ හෙන්රි රජතුමා ද නොකඩවා ම සාගර ගමන් සඳහා ජනතාව පෙලඹවී ය.

- ★ ක්‍රි.ව. 1488 දී බර්තොලමියු ඩයස් අත්ලාන්තික් සාගරය ඔස්සේ යාත්‍රා කොට අප්‍රිකාවේ දකුණු දිග පිහිටි කුණාටු තුඩුව (සුබ පැතුම් තුඩුව) කරා ළඟා වීමට සමත් විය.
- ★ ක්‍රි.ව. 1497 දී පෙරදිග බලා පැමිණීම සඳහා ගමන ආරම්භ කළ වස්කෝ ද ගාමා ද බර්තොලමියු ඩයස් ගමන් ගත් මාර්ගය ඔස්සේ ම ගමන් කළ අතර, කුණාටු තුඩුව පසු කොට ඉන්දියාවේ කැලිකට් වරායට ළඟා වීමට සමත් විය.

වස්කෝ ද ගාමා විශාල වස්තු සම්භාරයක් ද රැගෙන පෙරළා පෘතුගාලයට පැමිණීම ගැන රජතුමා මහත් සතුටට පත් විය. ඉන්දියාව සමඟ වෙළෙඳාම් කොට ලාභ ලබා ගැනීමට රජතුමාට අවශ්‍ය විය. ඒ සඳහා ඉන්දියාවේ වෙරළ දිගේ වෙළෙඳ ගබඩා හා බළකොටු තැනවිය යුතු බව එතුමා තීරණය කළේ ය. තම බලාපොරොත්තු ඉටු කර




වස්කෝ ද ගාමාගේ පෙරදිග ගමන් මාර්ගය

ගැනීම සඳහා විශාල නැව් කණ්ඩායමක් ඉන්දියාව බලා පිටත් කර යැවී ය.



රුවල් නැව

★ 1505 මාර්තු 24 වන දින දොන් ෆ්‍රැන්සිස්කෝ ද අල්මේද නමැති පෘතුගීසි සෙන්පතියා ඉන්දියාවට පැමිණියේ ය. ඔහු ඉන්දියන් සාගරයේ සිටි මුස්ලිම් වෙළෙඳුන් පන්නා දමා, එහි වෙළෙඳාම සියතට ගැනීමට පියවර ගත්තේ ය. ඉන්දියන් සාගරයේ වෙළෙඳ බලය ලබා ගැනීම සඳහා ෆ්‍රැන්සිස්කෝ ද අල්මේද විසින් තම පුත්‍රයා වන ලොරෙන්සෝ ද අල්මේදගේ නායකත්වයෙන් යුත් නැව් කණ්ඩායමක්, මාලදිවයින දෙසට පිටත් කර හරින ලදි. එසේ පැමිණි නැව් කණ්ඩායම බිහිසුණු කුණාටුවකට හසු වී වෙනත් දිශාවකට ගසා ගෙන ගොස් ගාලු වරායට සේන්දු විය.

★ ක්‍රි.ව. 1507 දී පෙරදිග පෘතුගීසි බල ප්‍රදේශවල පාලකයා ලෙස පැමිණි ඇල්බුකර්ක් නමැත්තා ඕම්ස්, මලක්කා හා සොකොත්‍රා අල්ලා ගැනීමෙන් ඉන්දියන් සාගරයේ

වෙළෙඳ බලය තහවුරු කර ගත්තේ ය. 1510 දී ඉන්දියාවේ ගෝව අල්ලාගෙන එය තම පෙරදිග වෙළෙඳ මධ්‍යස්ථානය බවට පත් කර ගත්තේ ය.

1498 දී ඉන්දියාවට පැමිණි පෘතුගීසීහු 1510 වන විට ඉන්දියාවේ වෙරළ ආසන්න ප්‍රධාන නගර සහ වරායයන් ද ඉන්දියන් සාගරය හරහා වැටී තිබූ වැදගත් වෙළෙඳ මධ්‍යස්ථානවල ද වෙළෙඳ බලය ලබා ගැනීමට සමත් වූහ.

**අභ්‍යාස**

1. ඉන්දියන් සාගරය අවට පිහිටි රටවල් පහක් නම් කරන්න.
2. ඉන්දියන් සාගරයේ පිහිටි වැදගත් වරායයන් පහක් නම් කරන්න.

## පෘතුගීසීන් පැමිණෙන අවධියේ ශ්‍රී ලංකාවේ පැවති දේශපාලන පසුබිම

ක්‍රි. ව. 1505 දී පෘතුගීසීහු ශ්‍රී ලංකාවට ගොඩබටහ. පෘතුගීසීන් පැමිණෙන විට ශ්‍රී ලංකාවේ ප්‍රධාන පාලන මධ්‍යස්ථාන තුනක් විය.

- කෝට්ටේ
- කන්ද උඩරට
- යාපනය

මීට අමතර ව උතුරු මැද, නැගෙනහිර හා ගිනිකොන දිග ප්‍රදේශවල ප්‍රාදේශීය නායකයන් යටතේ වන්නි රාජ්‍ය කිහිපයක් පැවතිණි. වන්නිය, තමන්කඩුව, නුවර කලාවිය, පානම සහ යාල යනාදිය එබඳු වන්නි රාජ්‍ය පිහිටි ප්‍රදේශ විය.

## කෝට්ටේ රාජධානිය



කෝට්ටේ නගර සැලැස්ම

ශ්‍රී ජයවර්ධනපුර හෙවත් කෝට්ටේ අග නගරය අලගක්කෝණාර නම් දක්ෂ සෙන්පතියකු විසින් ගොඩනගන ලදි. කොලොන්නා ඔය හා දියවන්නා ඔයෙන් වට වූ ජල දුර්ගයක් ලෙස කෝට්ටේ නගරය හැඳින්විය හැකි ය.

කෝට්ටේ රාජධානිය විශාලතම, ප්‍රධානතම මෙන් ම බල සම්පන්නතම රාජධානිය විය. එහි පාලකයා ලංකාවේ අසහාය පාලකයා ලෙස පිළිගනු ලැබිණි. කෝට්ටේ රජතුමා හැඳින්වීමට "ලංකාධීශ්වර", "චක්‍රවර්ති" යන විරුද නාම භාවිත විය. බලසම්පන්න රජවරුන් කෝට්ටේ රජ කළ අවධියේ දී අනෙක් පාලන මධ්‍යස්ථානවල සිටි පාලකයන් එතුමාගේ බලය පිළිගනු වස් පුද පඬුරු රැගෙන

කෝට්ටේ රජතුමා බැහැදැකීමේ සම්ප්‍රදයයක් පැවතිණි. කෝට්ටේ රාජධානිය සතු ව පැවති මෙම තත්ත්වය 16 වන සියවස වන විට ක්‍රමයෙන් හීන වෙමින් යනු පෙනේ.

කෝට්ටේ රාජධානිය ආහාර අතින් ස්වයංපෝෂිත වූ අතර එය ආර්ථික අතින් ද ධනවත් ම පාලන ඒකකය විය.




16 වන සිය වස ආරම්භයේ දී ශ්‍රී ලංකාව

| කෝට්ටේ රාජධානියේ සීමා | |
|---|---|
| උතුරින් | මල්වතු ඔය |
| බටහිරින් | ඉන්දියන් සාගරය |
| නැගෙනහිරින් | මධ්‍යම කඳුකරයේ බටහිර බෑවුම |
| දකුණින් | වලවේ ගඟ |




**1505 දී පෘතුගීසීන් දිවයිනට පා තබන විට කෝට්ටේ පාලකයා වූයේ අට වන වීර පරාක්‍රමබාහු රජතුමා ය.**

## කන්ද උඩරට රාජධානිය

**පෘතුගීසීන් පැමිණෙන විට කන්ද උඩරට පාලකයා වූයේ සේනා සම්මත වික්‍රමබාහු රජතුමා ය.**

## යාපනය රාජධානිය

යාපන අර්ධද්වීපය හා තදාසන්න දූපත්වලින් යාපනය රාජ්‍යය සමන්විත විය. 14 වන සියවසේ සිට ආර්ය චක්‍රවර්ති පරපුරෙන් පැවත එන අය මෙහි පාලකයෝ වූහ.

**පෘතුගීසීන් පැමිණෙන විට පරරාජසේකරම් යාපනයේ රජතුමා විය.**

## වන්නි පාලන ප්‍රදේශය

උතුරු මැද හා නැගෙනහිර ප්‍රදේශවල විසිර පැවති කුඩා ප්‍රාදේශීය පාලන ඒකක වන්නි ප්‍රදේශ නමින් හැඳින්වේ.

වන්නි පාලන ප්‍රදේශවල පාලකයෝ වන්නියාර්වරු නම් වූහ.

**ක්‍රියාකාරකම්**

01) පහත සඳහන් වගුව ඔබේ අභ්‍යාස පොතේ පිටපත් කරගෙන සම්පූර්ණ කරන්න.

| පෙරදිගට පැමිණි බටහිර ජාතීන්ගේ මව් බිම | අගනුවර | පෙරදිග මධ්‍යස්ථානය |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |
| 4 | | |

02) ඉහත වගුවේ සඳහන් තොරතුරු ලෝක සිතියමක ලකුණු කරන්න.

03) පහත සඳහන් වගුව ඔබේ අභ්‍යාස පොතේ පිටපත් කරගෙන සම්පූර්ණ කරන්න.

| පෘතුගීසීන් පැමිණෙන විට ලංකාවේ පැවති ප්‍රධාන පාලන ඒකක | පාලකයෝ | පාලන ඒකකයට අයත් ප්‍රදේශ |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |

04) ශ්‍රී ලංකාවේ සිතියමක පහත සඳහන් ස්ථාන හා ගංගා ලකුණු කරන්න.

1. කෝට්ටේ නගරය
2. මහනුවර නගරය
3. තමන්කඩුව
4. කොට්ටියාරම
5. යාල
6. පානම
7. යාපනය
8. කැලණි ගඟ
9. වලවේ ගඟ
10. මල්වතු ඔය
11. කුඹුක්කන් ඔය
12. ගල් ඔය
13. මහවැලි ගඟ

## පෘතුගීසීන් කෝට්ටේ රාජ්‍යය තුළ බලය පිහිටුවා ගැනීම

මුහුදු කුණාටුවකට හසු වී අහම්බෙන් ගාලු වරායට පැමිණි ලොරෙන්සෝ ද අල්මේද තමා පා තබා ඇත්තේ ශ්‍රී ලංකාවට බව දැන ගත් විට ඉමහත් ප්‍රීතියට පත් විය. පෘතුගීසීන් ශ්‍රී ලංකාව ගැන අසා තිබුණේ කුරුඳු, ගම්මිරිස් ආදි කුළුබඩු සහ මුතු මැණික් බහුල ව පවතින රටක් ලෙස ය. රජතුමා බැහැදැක තමන්ට අවශ්‍ය වෙළෙඳ ද්‍රව්‍ය ලබා ගැනීමේ බලාපොරොත්තුවෙන් ලොරෙන්සෝ ද අල්මේද 1505 දී කොළඹට ළඟා විය. පෘතුගීසීන්ගේ පැමිණීමෙන් කලබලයට පත් වූ මුස්ලිම්වරු ඔවුන්ට පහර දී එළවා දැමීමට තැත් කළහ. එහෙත් පෘතුගීසීහු තම නැව්වල සවි කොට තිබූ කාලතුවක්කුවලින් වෙඩි හඬ නිකුත් කොට මුස්ලිම්වරුන් පසු බැස්වීමට සමත් වූහ. කිසි ද වෙඩිහඬ අසා නො තිබුණු සිංහලයෝ ඉමහත් භීතියට හා පුදුමයට පත් වී වහා ම රජතුමාට තොරතුරු දන්වා සිටියහ.

රාජාවලියට අනුව බියට පත් වූ රට වැසියන් විසින් පෘතුගීසීහු මෙසේ හඳුන්වන ලද හ. "අපගේ කොළොම්තොටට ඉතා සුදු පැහැති මනුෂ්‍ය ජාතියක් පැමිණ සිටිති. යකඩ හැට්ට ඇඟලා යකඩ තොප්පි පැළඳගෙන විගස එකතැන නො සිට ගමන් කරත්තෝ ය. සුදු ගල් සපා කමින් ලේ බොන්නෝ ය ......... ඔවුන්ගේ තුවක්කු ගව් ගණන් ගොසින් වන් කල යුගන්ධර පර්වතය පවා පොඩි වන්නේ ය. " (රාජාවලිය)

තමන් හමුවට පැමිණෙන ලෙසට රජතුමා පෘතුගීසීන්ට දන්වා යැවී ය. මෙම ඉල්ලීම පිළිගත් ලොරෙන්සෝ ද අල්මේද තම නියෝජිතයකු කෝට්ටේ රජවාසලට යැවීමට කටයුතු කළේ ය. පෘතුගීසි නියෝජිතයාට මඟ පෙන්වීමට ගිය රට වාසීන් පුරා දින තුනක් විවිධ මාර්ග ඔස්සේ ගමන් කොට, රජවාසල කරා ළඟා වූ බව වාර්තා වේ. කෝට්ටේ රජවාසලේ සිටිය දී තම කාලතුවක්කු හඬ ශ්‍රවණය කළ පෘතුගීසි නියෝජිතයා කොළඹ හා කෝට්ටේ රජවාසල අතර ඇත්තේ ඉතා කෙටි දුරක් බව අවබෝධ කර ගත්තේ ය.

**"පරංගියා කෝට්ටේ ගියා වගේ"** යන ජනප්‍රවාදය මෙම සිදු වීම මුල් කොටගෙන භාවිතයට පැමිණ ඇත.

තම නියෝජිතයා සාදරයෙන් පිළිගත් බව දැන ගත් ලොරෙන්සෝ ද අල්මේද ඉමහත් ප්‍රීතියට පත් ව වඩා ස්ථිර ගිවිසුමක් ඇති කර ගැනීම සඳහා නැවතත් නියෝජිතයකු රජතුමා හමුවට යැවී ය. රජතුමා හා නියෝජිතයා අතර ඇති වූ සුහද සාකච්ඡාවෙන් පසු පෘතුගීසීන් හා රජතුමා අතර එකඟතාවක් ඇති විය.



ගලක කොටන ලද පෘතුගීසි ලාංඡනය

ලොරෙන්සෝ ද අල්මේද රජතුමාගේ අවසරය ඇති ව වෙළෙඳ ගබඩාවක් ද පල්ලියක් ද තැනවී ය. තම ලංකා ගමන සිහිවීම පිණිස ඔහු විසින් පෘතුගීසි රාජ්‍ය ලාංඡනය ගලක කෙටවී ය.

වෙළෙඳ ගබඩාව ඉදි කිරීම ගැන මුස්ලිම්වරුන් හා සිංහල ජනතාව ද තම විරෝධය පළ කළහ. වෙළෙඳ ගබඩාව වසා දැමූ පෘතුගීසීහු ඉන්දියාව බලා පෙරළා ගියහ. එසේ වුව ද කුරුඳු මිල දී ගැනීම සඳහා වරින් වර ලංකාවට පැමිණියහ. ක්‍රි. ව. 1509 දී අට වන වීර පරාක්‍රමබාහු රජතුමාගේ මරණින් පසුව නව වන ධර්ම පරාක්‍රමබාහු රජතුමා බලයට පත් විය.

ක්‍රි.ව. 1518 දී සෙන්පති ලෝපෝ සෝරස් ද අල්බර්ගේරියා යටතේ බලසම්පන්න නැව් කණ්ඩායමක් කොළඹට ළඟා විය. මෙවර ද මුස්ලිම්වරු සිංහල ජනතාව එක් කොට ගෙන පෘතුගීසීන්ට පහර දුන්හ. කාලතුවක්කුවලින් වෙඩි තබමින් විරුද්ධකරුවන් පසු බැස්වීමට පෘතුගීසීහු සමත් වූහ. අනතුරුව පෘතුගීසීහු කොළඹ වරායට යාව කොටුවක් ගොඩනැගූහ.



කොළඹ කොටුව

කොටුව තැනීම ගැන නොසන්සුන් වූ සිංහල ජනතාව මුස්ලිම්වරුන් සමඟ එක් ව එය කඩා දමූහ. පෘතුගීසීන් රජතුමාට මේ පිළිබඳ ව දන්වා සිටිය ද විසඳුමක් ලබා දීමට රජතුමා අපොහොසත් විය.

ධර්ම පරාක්‍රමබාහු රජුගෙන් පසු ව 1519 බලයට පත් හයවන විජයබාහු රජතුමා පෘතුගීසි විරෝධී වැඩ පිළිවෙළක් අනුගමනය කළේ ය.

මුස්ලිම්වරුන්ගේ ආධාර ඇති ව රජතුමා කොළඹ කොටුව වැටලී ය. 1521 දී පෘතුගීසීන් නැවත කොටුවක් තැනීමට කටයුතු කළ අතර තමා කොටුව තැනීමට විරුද්ධ බව රජතුමා ප්‍රසිද්ධියේ ප්‍රකාශ කළේ ය. මුස්ලිම් සේනාව සමඟ එක් ව නැවත සිංහල ජනතාව පෘතුගීසීන්ට විරුද්ධ ව ප්‍රහාර එල්ල කළ ද එය ද අසාර්ථක විය.

## විජයබා කොල්ලය - 1521

හයවන විජයබාහු රජතුමාගේ පළමු විවාහයෙන් බුවනෙකබාහු, රයිගම් බණ්ඩාර (පරරාජසිංහ), මායාදුන්නේ නම් පුතුන් තිදෙනෙක් වූහ. රජතුමා දෙවන වර විවාහ කොට ගත් කීරවැල්ලේ බිසවට ද ඇයගේ කලින් විවාහයෙන් ලත් දේවරාජ නම් පුතෙක් විය. එම දෙවන බිසවගේ ඉල්ලීම පරිදි දේවරාජට රාජ්‍ය උරුමය ලබා දීමට විජයබාහු රජතුමා සූදානම් වන බව දැන ගත් කුමාරවරු තිදෙනා රජු සමඟ අමනාප වූහ. පිය රජතුමා රාජ මාලිගාව තුළ දී ම ඝාතනයට ලක් විය. 1521 **"විජයබා කොල්ලය"** නමින් හැඳින්වෙන මෙම සිද්ධියෙන් පසුව කෝට්ටේ රාජධානිය කොටස් තුනකට බෙදී ගියේ ය.

ඒ අනුව

- ✷ කෝට්ටේ - හත්වන බුවනෙකබාහු
- ✷ රයිගම - රයිගම බණ්ඩාර
- ✷ සීතාවක - මායාදුන්නේ යන අය පාලකයෝ බවට පත් වූහ.

ඒවා අතුරින් කෝට්ටේ ප්‍රධාන රාජ්‍යය විය. කෝට්ටේ රජ කළ හත්වන බුවනෙකබාහු රජතුමා නිරන්තරයෙන් මායාදුන්නේ රජතුමා ගැන සැකයෙන් පසු විය. විජයබා කොල්ලයේ දී ප්‍රධාන මෙහෙවරක් ඉටු කළ රණශූර මායාදුන්නේ සීතාවකින් පමණක් සෑහීමට පත් නොවන බව බුවනෙකබාහු රජතුමා දැන සිටියේ ය. තම සහෝදරයාගේ රණශූර බව ගැන දැන සිටි බුවනෙකබාහු රජතුමා නිතර ම පෘතුගීසීන්ගේ පිළිසරණ පැතී ය. කෝට්ටේ රාජ්‍යය බෙදී යෑම එහි බලය හීන වීමට හේතු විය. වැඩි වශයෙන් පෘතුගීසීන්ට කෝට්ටේ රාජධානියේ කටයුතු කෙරෙහි මැදිහත් වීමේ අවස්ථාව උදාවන්නේ ද අවසානයේ කෝට්ටේ රාජධානිය පෘතුගීසීන් සතුවන්නේ ද මෙහි ප්‍රතිඵලයක් ලෙස ය.

| කෝට්ටේ රාජධානිය අත්පත් කර ගැනීමට මායාදුන්නේ රජු විසින් දරන ලද ප්‍රයත්න | | | | | |
|---|---|---|---|---|---|
| වර්ෂය | කෝට්ටේ රජතුමා | ලබාගත් ආධාර | මායාදුන්නේ රජතුමා | ලබාගත් ආධාර | ප්‍රතිඵල |
| ක්‍රි.ව. 1528 | හත් වන බුවනෙකබාහු | පෘතුගීසීන් ගේ ආධාර ගෝවේ ප්‍රතිරාජයා | කෝට්ටේට පහරදීම | කැලිකට්හි සැමොරින් මායාදුන්නේ රජතුමාගේ ඉල්ලීම අනුව කොළඹ කොටුවට පහරදීම | මායාදුන්නේ පරාජයට පත් වීම |
| ක්‍රි.ව. 1537 | හත් වන බුවනෙකබාහු | පෘතුගීසීන් ගේ කපිතාන් ජනරාල් අපොන්සු ද සූසා | කෝට්ටේට පහරදීම | මායාදුන්නේගේ ආධාර පිණිස පැමිණි සැමොරින් ගේ නැව් කණ්ඩායම වේදලායි සටනින් පරාජය වීම | මායාදුන්නේ රජු බුවනෙකබාහු රජතුමා සමග සාමදනයක් ඇති වීම |
| ක්‍රි.ව. 1539 | හත් වන බුවනෙකබාහු | මිගෙල් පෙරේරා | කෝට්ටේට පහරදීම | මායාදුන්නේගේ සහායට පැමිණීම | මිගෙල් පෙරේරා සැමෝරින්ගේ සෙන්පතිවරු පාවා දීම සඳහා කළ ඉල්ලීමට මායාදුන්නේ රජු එකඟ වීම නිසා මායාදුන්නේ සහ සැමොරින් අතර අමනාපකම් ඇති වීම |
| ක්‍රි.ව. 1543 | හත් වන බුවනෙකබාහු | අන්තෝනි බරෙන්තු | කෝට්ටේ වටලෑම | 1539 න් පසුව සැමොරින් මායාදුන්නේට ආධාරයට නොපැමිණීම | මායාදුන්නේ පරාජය වීම |
| ක්‍රි.ව. 1557 | ධර්මපාල රජතුමා | පෘතුගීසී ද ලසර්ද | මායාදුන්නේ රජු | 1539 න් පසුව සැමොරින් මායාදුන්නේට ආධාරයට නොපැමිණීම | මායාදුන්නේ පරාජය වීම |
| ක්‍රි.ව.1562 මුල්ලේරියා සටන | ධර්මපාල රජතුමා | පෘතුගීසී ද ලසර්ද | ටිකිරි කුමරු මායාදුන්නේ රජු | විදේශ ආධාර නොමැත | පෘතුගීසීන් අන්ත පරාජයට පත් වීම |
| ක්‍රි.ව. 1564 | ධර්මපාල රජතුමා | පෘතුගීසින් හමුදා සටන මෙහෙයවීම | කොළඹ කොටුවට හා කෝට්ටේට එකවර පහරදීම | බාහිර ආධාර නොමැත | අගනුවර කෝට්ටේ සිට කොළඹ බලා මාරු වීම |

1527 සිට 1537 දක්වා අවුරුදු දහය තුළ පෘතුගීසීන් පලවා දමා කෝට්ටේ රාජධානිය අත්පත් කරගැනීමට මායාදුන්නේ ගත් සෑම උත්සාහයක් ම අසාර්ථක විය. ඒ සෑම වාරයක දී ම පෘතුගීසි සහාය ලබා ගැනීමට බුවනෙකබාහු රජතුමාට සිදු විය. ඉන් වඩ වඩාත් පෘතුගීසීන්ට තම බලය කෝට්ටේ රාජ්‍යය තුළ තහවුරු කර ගැනීමට හැකි විය. 1537 සිට 1547 දක්වා කෝට්ටේ හා සීතාවක අතර සාමකාමී වාතාවරණයක් පැවතුණි.

## ධර්මපාල කුමාරයා

බුවනෙකබාහු රජතුමාගේ දියණියගේ පුත්‍රයා වූ ධර්මපාල කුමරුට කෝට්ටේ රාජ්‍යය හිමි කර දීම බුවනෙකබාහු රජතුමාගේ එක ම අභිප්‍රාය විය. එම අභිප්‍රාය ඉටු කර ගැනීමට මායාදුන්නේගෙන් බාධා පැමිණෙන බව දැන සිටි බුවනෙකබාහු රජතුමා පෘතුගීසි සහාය පැතී ය. ධර්මපාල කුමරුගේ පිළිරුවක් තනවා බොහෝ පුද පඬුරු ද සමඟ පෘතුගාලයේ රජු වෙත යැවූ බුවනෙකබාහු රජතුමා " තමාගෙන් පසු ධර්මපාල කුමරු ලංකා රාජ්‍යයේ උරුමක්කාරයා හැටියට පිළිගන්නා ලෙසත් ඔහුට ආරක්ෂාව සලසන ලෙසත් ඉල්ලා සිටියේ ය.

පෘතුගාල රජතුමා වඩාත් සතුටු කිරීම සඳහා තම රට වැසියන් අතර ක්‍රිස්තු ධර්මය ප්‍රචාරය කිරීම පිණිස මිෂනාරිවරුන් කිහිප දෙනකු එවන ලෙස ද බුවනෙකබාහු රජතුමා තවදුරටත් ඉල්ලා සිටියේ ය.

1543 දී ධර්මපාල කුමරුගේ පිළිරුවට මහත් උත්සවශ්‍රීයෙන් ලිස්බන් නගරයේ දී ඔටුනු පළඳවන ලදි.

රජතුමාගේ ඉල්ලීම පරිදි 1543 දී ප්‍රැන්සිස්කානු පූජකවරු හතර දෙනෙක් ශ්‍රී ලංකාවට පැමිණියහ. රාජ්‍ය අනුග්‍රහය ද සහිත ව ඉතා සාර්ථක ව ධර්ම ප්‍රචාරක කටයුතු ව්‍යාප්ත කිරීමට ඔවුහු යුහුසුළු වූහ. ඒ අනුව මීගමුව, මෝදර, මොරටුව, පානදුර, මග්ගොන, බේරුවල ආදි ප්‍රදේශවල ජනතාව අතර කතෝලික ආගම ප්‍රචාරය කෙරිණි.

බුවනෙකබාහු රජතුමා කතෝලික ආගම වැලඳ ගැනීම ප්‍රතික්ෂේප කිරීම නිසාත් මායාදුන්නේ පෘතුගීසීන්ට පාවාදීමට අකැමති වූ නිසාත් පෘතුගීසීහු රජතුමා කෙරෙහි අමනාපයෙන් පසු වූහ.

## හත්වන බුවනෙකබාහු රජතුමාගේ අභාවය

මහලු වියට පත් බුවනෙකබාහු රජතුමා විවේක ගැනීම සඳහා කැලණියේ තම මාලිගාව වෙත පැමිණියේ ය. තම පියාගේ ඝාතනය හා පෘතුගීසීන්ගේ සහාය නිරන්තරයෙන් ලබා ගැනීමට සිදු වීම, එතුමාගේ පසුතැවීමට හේතු විය.

මාලිගයේ උඩු මහලේ සක්මන් කරමින් සිටිය දී පෘතුගීසි භටයකුගේ වෙඩි පහරක් වැදීමෙන් රජතුමා අභාවයට පත් විය. 1551 දී රජතුමා මියයෑමත් සමඟ රාජ්‍ය උරුමකරුවා ලෙස නම් කොට සිටි ධර්මපාල කුමාරයා ළදරු වියේ පසු වූ නිසා ඔහුගේ පියා වූ වීදියේ බණ්ඩාර රාජ්‍ය පාලන කටයුතු පවරා ගත්තේ ය. මායාදුන්නේ හා පෘතුගීසීන් සමඟ ගැටුම් ඇති කර ගත් මෙතුමා යාපනයට පැන ගියේ ය. පසු කලෙක ඇති වූ ගැටුමකින් වීදියේ බණ්ඩාර යාපනයේ දී ජීවිතක්ෂයට පත් විය. වීදියේ බණ්ඩාර ඉවත් ව යෑමත් සමඟ ළදරු ධර්මපාල කුමරු කෝට්ටේ රජ තනතුරට පත් විය.

1557 දී ධර්මපාල රජතුමා දොන් ජුවන් පෙරිය බණ්ඩාර නමින් බෞතීස්ම ලැබී ය.

තම රජතුමා අන්‍ය ආගමිකයකු වීම ගැන නො සතුටට පත් වූ භික්ෂූන් වහන්සේලා හා බොහෝ බෞද්ධ පිරිස් දන්ත ධාතූන් වහන්සේ ද රැගෙන කෝට්ටේ අත්හැර සීතාවක මායාදුන්නේ රජු වෙත ගියහ.

මායාදුන්නේ හා ටිකිරි කුමරු 1564 කොළඹ කොටුවට හා කෝට්ටේට එකවර පහර දුන්නෝ ය. කෝට්ටේ හා කොළඹ යන නගර දෙක ම සතුරන්ගෙන් ආරක්ෂා කර ගැනීමට අපහසු බව වටහා ගත් පෘතුගීසීහු කෝට්ටේ අතහැර ධර්මපාල රජතුමා ද රැගෙන කොළඹට පැමිණියහ.

ක්‍රි.ව. 1565 රජතුමා කෝට්ටේ අතහැර යෑමත් සමඟ අවු. 150ක් පමණ අගනුවර වශයෙන් පැවති කෝට්ටේ රාජධානිය ශීඝ්‍රයෙන් පරිහානියට පත් විය.

කොළඹට ළඟා වූ ධර්මපාල රජතුමා පෘතුගීසීන්ගේ අවශ්‍යතා මත ක්‍රියා කරන රූකඩ පාලකයකු බවට පත් විය.

1580 අගෝස්තු 12 වන දින ධර්මපාල රජතුමා පෘතුගීසීන්ගේ බලපෑම් මත කෝට්ටේ රාජධානිය තෑගි ඔප්පුවකින් ඔවුන් වෙත පවරා දුන්නේ ය.

තෑගි ඔප්පුවේ සඳහන් වූ එක් වගන්තියක් වූයේ ධර්මපාල රජතුමාට දරුවන් නොමැති වුවහොත් කෝට්ටේ රාජ්‍යය පෘතුගීසීන් සතු වන බව ය. ධර්මපාල රජතුමාට දරුවන් නොසිටි නිසා 1597 මැයි 29 වන දින ධර්මපාල රජතුමා මිය යෑමත් සමඟ කෝට්ටේ රාජධානිය පෘතුගීසීන් සතු විය.

රජතුමාගේ අභාවයෙන් දෙදිනකට පසු පෘතුගීසි කපිතාන් ජනරාල් ජෙරනිමෝ ද අස්වේදු **මල්වානේ** රැස්වීමක් කැඳවා පෘතුගීසි ධජය ඔසවා කෝට්ටේ රාජධානිය පෘතුගාල රජුට හිමි බව ප්‍රකාශ කළේ ය.



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

රටේ පවතින චිරාගත සම්ප්‍රදයය සහ නීති රීති අනුව කෝට්ටේ රාජධානියේ පාලනය ගෙන යන බවට කපිතාන් ජනරාල්වරයා මල්වානේ රැස්ව සිටි රදල ප්‍රධානීන්ට පොරොන්දු විය. මෙතැන් පටන් පෘතුගීසීහු කෝට්ටේ රාජධානියේ නීත්‍යානුකූල හිමිකරුවන් බවට පත් වූහ.

**ක්‍රියාකාරකම්**

1. "කෝට්ටේ රාජධානිය පෘතුගීසීන් අතට පත් වීමට හේතු වූයේ මායාදුන්නේගේ ක්‍රියා කලාපය යි /බුවනෙකබාහු රජුගේ ක්‍රියා කලාපය යි " යන මැයෙන් විවාදයක් පවත්වන්න.
2. පෘතුගීසීන්ට කෝට්ටේ රාජ්‍යය අත්පත් කොට ගැනීමට උපකාරී වූ කරුණු විස්තර කොට බිත්ති පුවත්පතකට ලිපියක් සම්පාදනය කරන්න.
3. කෝට්ටේ රාජධානිය බෙදී ගිය ආකාරය ශ්‍රී ලංකා සිතියමක ඇඳ දක්වන්න.

## පෘතුගීසීන් සීතාවක රාජ්‍යය සමඟ පැවැත්වූ සම්බන්ධතා

"විජයබා කොල්ලය" නිසා 1521 දී සීතාවක රාජධානිය බිහි විය. එහි ප්‍රථම පාලකයා වූයේ රණශූර මායාදුන්නේ ය. ඔහු කෝට්ටේ රාජධානිය අල්ලා ගැනීමට බලාපොරොත්තු වුව ද කෝට්ටේ රජතුමා නිරන්තරයෙන් පෘතුගීසි සහාය ලබා ගැනීම ඊට බාධාවක් විය. තමන් සතු නාවික හමුදාවක් නොමැති ව පෘතුගීසීන් පන්නා දැමීමට නොහැකි බව වටහා ගත් මායාදුන්නේ රජතුමා ඒ සඳහා කැලිකට්හි සැමොරින්ගේ ආධාර උපකාර පැතී ය.

## සීතාවක රාජධානිය නැගීම

✷ 1538 සිදු වූ රයිගම් බණ්ඩාරගේ මරණින් පසු රයිගම ඈඳ ගැනීමෙන් තවදුරටත් සීතාවක රාජ්‍යය විශාල කර ගැනීමට මායාදුන්නේට හැකි විය.

✷ 1527 සිට 1537 දක්වා කෝට්ටේ අත්පත් කර ගැනීමට ගත් සෑම උත්සාහයක් ම අසාර්ථක වීම නිසා මායාදුන්නේ තම ප්‍රතිපත්තිය වෙනස් කොට බුවනෙකබාහු රජතුමා සමඟ සමාදානයක් ඇති කරගත්තේ ය.

**සීතාවක බලය වර්ධනය වීමට බලපෑ හේතු**

❊ කෝට්ටේ ධර්මපාල රජතුමා 1557 දී කතෝලික ආගම වැලඳ ගැනීම.

❊ භික්ෂූන් වහන්සේලා හා බෞද්ධ ජනතාව විශාල වශයෙන් කෝට්ටේ අතහැර සීතාවකට යෑම.

❊ මායාදුන්නේ රජතුමා බුදු දහමෙහි ආරක්ෂකයා ලෙස ජනතාව විසින් පිළිගනු ලැබීම.

❊ රාජ්‍යත්වයේ උරුමයේ සංකේතයක් සේ සැලකුණු දන්ත ධාතූන් වහන්සේ මායාදුන්නේ රජුට හිමි වීම.

❊ දන්ත ධාතූන් වහන්සේ දෙල්ගමු විහාරයේ කුරහන් ගලක් තුළ ආරක්ෂා සහිත ව තැන්පත් කර තබා එයට පුද පූජා පැවැත්වීම.

❊ මායාදුන්නේ රජුගේ හා ඔහුගේ පුත් රාජසිංහ කුමරුගේ දක්ෂතාව.

මායාදුන්නේ කොළඹ හැරුණු විට මුළු කෝට්ටේ රාජධානියේ ම ස්වාමියා බවට පත් විය. ඒ අනුව කෝට්ටේ, සීතාවක, රයිගම, දෙනවක, සත්කෝරලය, මොහු යටතට පත් විය. 1521 කුඩා ප්‍රාදේශීය රාජ්‍යයක් ලෙස ආරම්භ වූ සීතාවක 1579 වන විට දිවයිනේ ප්‍රබල ම රාජ්‍යය බවට පත් ව තිබිණ.




4.1 රූපය - සීතාවක රාජ්‍යයේ නැගීම

## මුල්ලේරියාවේ සටන - 1562

පෘතුගීසීන් ශ්‍රී ලංකාවෙන් පලවා හැරීමේ පරම අධිෂ්ඨානයෙන් ක්‍රියා කළ මායාදුන්නේ රජු පෘතුගීසීන්ට එරෙහි ව දියත් කළ සටන්වල දී ඔහුගේ පුත් රණශූර ටිකිරි කුමාරයා පෙරමුණ ගත්තේ ය. ඔහුගේ නැගී සිටීම නොඉවසූ පෘතුගීසීහු සීතාවක ආක්‍රමණය කිරීමට සැලසුම් කොට 1562 දී ද ලසර්ද යටතේ හමුදවක් පිටත් කොට හැරියෝ ය. මායාදුන්නේ රජු ද ටිකිරි කුමාරයා යටතේ හමුදවක් එවූ අතර මුල්ලේරියාවේ දී මුහුණට මුහුණ ලා හමු වූ සේනා දෙක අතර දරුණු සටනක් ඇති විය. එහි දී පෘතුගීසි හමුදාව අන්ත පරාජයකට පත් විය. මෙය පෘතුගීසීන් එම අවධියේ දී ලත් දරුණුතම පරාජය ලෙස සැලකේ. එය සීතාවක රාජ්‍යයේ ව්‍යාප්තියේ වැදගත් සංධිස්ථානයක් ද විය.

## පළමු වන රාජසිංහ රජතුමා

1581 දී මායාදුන්නේ රජුගේ අභාවය සිදු විය. අනතුරු ව ඔහු පුත් ටිකිරි කුමරු රාජසිංහ නමින් සීතාවක රජ විය. කුඩා කල සිට සටන් බිමෙහි දස්කම් දැක්වූ මෙතුමාගේ ද ඒකායන අධිෂ්ඨානය වූයේ, පෘතුගීසීන් මෙරටින් පලවා හැරීම යි.

## ✷ උඩරට රාජ්‍යය ඈඳා ගැනීම

1582 දී පළමුවන රාජසිංහ රජු විසින් උඩරට රාජ්‍යය ඈඳා ගැනීම සීතාවක රාජ්‍යයේ නැඟීමේ උච්චතම අවස්ථාව විය.

## කොළඹ කොටුව වටලෑම

උඩරට රාජ්‍යය ද කෝට්ටේ රාජ්‍යය ද සීතාවක රාජ්‍යයට ඈඳාගෙන පෘතුගීසීන් කොළඹ කොටුවට සීමා කොට සිටි රාජසිංහ රජුගේ ඊළඟ ප්‍රයත්නය වූයේ ඔවුන් කොළඹින් එළවා දැමීම ය. 1587 දී පළමුවන රාජසිංහ රජ පන්දහසක් පමණ සේනාවක් යොදවා කොළඹ කොටුවට පහර දුන්නේ ය. මාස 22ක් පෘතුගීසීන් කොළඹ කොටුව තුළ සිර කොට තබා ගැනීමට රජුට හැකි විය. කොටුව තුළ සිටි අය ආහාර හිඟයෙන් මහත් පීඩාවට පත් වූහ. ගෝවෙන් ආධාර ලැබීම හේතු කොට පෘතුගීසීන් යළි ශක්තිමත් වීම පෘතුගීසීන් පලවා හැරීමේ රජුගේ ප්‍රයත්නය අසාර්ථක වීමට බලපෑ ප්‍රධාන ම හේතුව විය.

## සීතාවක රාජ්‍යයේ පිරිහීම

උඩරට රාජ්‍යයේ පළමුවන විමලධර්මසූරිය රජතුමා බලයට පත් වීමත් සමඟ සීතාවක රාජසිංහ රජතුමාට එම රාජ්‍යයෙන් අභියෝග එල්ල විය. එතුමා 1592 පළමු වන විමලධර්මසූරිය රජතුමා අතින් අන්ත පරාජයට පත් වූ ආකාරය පළමුවන පරිච්ඡේදයෙන් ඉගෙන ගතිමු. දැඩි කැපවීමකින් අපමණ වෙහෙසවීමෙන් දරන ලද ප්‍රයත්නය අසාර්ථක වීම පළමුවන රාජසිංහ රජතුමාගේ සිත් තැවුලට හේතු විය. එය ඉහවහා ගිය කෝපයකට පත් වීම සමඟ රජතුමා දරුණු ක්‍රියාමාර්ගවලට අවතීර්ණ විය.

ශිව ආගම වැලඳ ගත් මෙතුමා බෞද්ධ විරෝධි ක්‍රියාමාර්ග අනුගමනය කළේ ය. තමාට විරුද්ධ යයි හැඟුණු සෑම දෙනා වග විභාගයකින් තොර ව විනාශ කර දැම්මේ ය.

උඩරට රාජ්‍යයේ පළමුවන විමලධර්මසූරිය රජතුමා අතින් පරාජයට පත් වූ පළමු වන රාජසිංහ රජතුමා ආපසු යන ගමනේ දී පෙතන්ගොඩ උයනේ දී උණ කටුවක් පතුලේ ඇනීම නිසා මරණයට පත් විය.

පළමුවන රාජසිංහ රජතුමා මිය යන විට සීතාවක රාජ්‍යයට නීත්‍යානුකූල හිමිකරුවකු නොවීමෙන් අවුල් වියවුල් රාශියක් ඇති විය. අවසානයේ කෝට්ටේ සහ සීතාවක යන රාජ්‍ය දෙකට ම අයත් ප්‍රදේශ ඒකාබද්ධ කොට පළමුවන රාජසිංහ රජු විසින් ගොඩනගා තිබූ ප්‍රබල සීතාවක රාජ්‍යය පහසුවෙන් අත්පත් කොට ගත් පෘතුගීසීහු එහි තිබූ වටිනා වස්තු කොල්ලකාගෙන සීතාවක තම මුරපොළක් ලෙස පවත්වා ගෙන ගියහ.



පෙතන්ගොඩ උයනේ ඇති කටු උණ ගස් ඔබට ද නැරඹිය හැකි ය. කටු උණ පඳුර



මුරපොළ

**අභ්‍යාසය**

1. සීතාවක රාජධානියේ නැගීමට සහ බිඳ වැටීමට හේතු වූ කරුණු පෙළගස්වන්න.
2. "සීතාවක රාජසිංහ රජුට නාවික හමුදාවක් තිබුණේ නම් පෘතුගීසීන් පරාජය කරනු නියත ය." මේ කියමනට පක්ෂ ව හා විපක්ෂ ව කරුණු රැස් කරන්න.
3. පළමුවන රාජසිංහ රජතුමාගේ කකුලේ උණ කටුවක් ඇනීම පිළිබඳ කියවෙන ජනකවියක් ලියන්න.
4. බිරන්ඩි කෝවිල පිළිබඳ කෙටි රචනයක් ලියන්න.

## පෘතුගීසින් උඩරට රාජ්‍යය සමඟ පැවැත්වූ සම්බන්ධතා

- කෝට්ටේ හා සීතාවක රාජධානිවලින් එල්ල වූ අභියෝගවලට මුහුණදීම සඳහා උඩරට රජවරුන් පෘතුගීසි ආධාර ලබා ගැනීමට පුරුදු ව සිටියහ.
- 1546 මායාදුන්නේ හා හත්වන බුවනෙකබාහු රජතුමා උඩරට ආක්‍රමණය කිරීම නිසා උඩරට රජ පෘතුගීසීන්ගෙන් ආධාර ඉල්ලා සිටීම එවැනි එක් අවස්ථාවකි.

## දන්තුරේ සටන 1594

පෘතුගීසීන් උඩරට රාජ්‍යය සමඟ පුළුල් සම්බන්ධතා ඇති කොට ගත්තේ පළමු වන විමලධර්මසූරිය රජතුමා සිහසුනට පත් වීමෙන් පසු ය. (ඔහු සිහසුනට පත් වූ ආකාරය අපි පළමුවන පරිච්ඡේදයෙන් ඉගෙන ගතිමු.)

කිතුදහම අතහැර බුදුදහම වැලඳ ගත් විමලධර්මසූරිය රජ බුද්ධ ශාසනයේ දියුණුවට කටයුතු කළේ ය. මෙම ක්‍රියා කලාපය පෘතුගීසීන්ගේ දැඩි අප්‍රසාදයට හේතු විය. පෘතුගීසීන් යටතේ හැදී වැඩී ඔවුන්ගේ යුද ශිල්පය හදරා රණශූරයකු වූ විමලධර්මසූරිය රජුගේ මෙම ක්‍රියා කලාපය පෘතුගීසීහු ඔවුන්ට ද්‍රෝහිවීමක් ලෙස සැලකූහ. ඒ අනුව රජතුමාට දඬුවම් කොට දෝන කතිරිනා කුමරිය උඩරට රැජින ලෙස පත් කිරීමේ අපේක්ෂාවෙන් පේරෝ ලොපෙස් ද සූසාගේ නායකත්වයෙන් උඩරටට සේනාවක් පිටත් කර යැවූහ. විමලධර්මසූරිය රජතුමා පලාගිය අතර ජනතාවගේ ආශීර්වාද මැද දෝන කතිරිනා උඩරට රැජින ලෙස රජකමට පත් වූවා ය. රැජිනගේ මුවාවෙන් පෘතුගීසීන් තම බලය කන්ද උඩරට පැතිරවීමට කටයුතු කිරීම ගැන ජනතා විරෝධය මතු විය. එනිසා උඩරට රැඳී සිටීම අවදානම් බව වටහා ගත් සූසා, දෝන කැතරිනා රැජිනිය ද රැගෙන කොළඹ බලා ඒමට පිටත් විය.

ජනතාවගේ සහයෝගය ලත් විමලධර්මසූරිය රජතුමා **"දන්තුරේ"** නම් ස්ථානයේ දී පෘතුගීසී හමුදාව සමූලඝාතනය කළ අතර එහි දී සූසා ද මරුමුවට පත් විය. විමලධර්ම සූරිය රජතුමා දෝන කැතරිනා කුමරිය විවාහ කරගෙන තම රාජ්‍යත්වය තහවුරු කර ගත්තේ ය.

## බලන සටන

දන්තුරේ සටනින් අන්ත පරාජයට පත් පෘතුගීසීහු 1602 දී කපිතාන් ජනරාල් දෙන් ජෙරනිමෝ ද අසවේදු යටතේ උඩරට ආක්‍රමණය කළහ. ප්‍රතිප්‍රහාර දුන් විමලධර්මසූරිය රජු "බලන" කපොල්ල ප්‍රදේශයේ දී යළිත් වරක් පෘතුගීසීන් අන්ත පරාජයට පත් කළේ ය.

## අසවේදුගේ දෙවන උඩරට ආක්‍රමණය

ක්‍රි.ව. 1610 දී දෙවන වරට ද අසවේදු උඩරට රාජ්‍යයට ආක්‍රමණයක් එල්ල කළේ ය. එවක සිහසුන දරා සිටි සෙනරත් රජතුමා පසුබැස ගිය අතර අසවේදු නගර කොල්ලකා, ගිනි තබා, පහතරට බලා ගමන් ගත්තේ ය. අනතුරුව සෙනරත් රජතුමා 1617 දී පෘතුගීසීන් සමඟ ගිවිසුමකට එළඹුණි.

### ක්‍රි. ව. 1617 සෙනරත් රජතුමා හා පෘතුගීසීන් අතර ඇති වූ ගිවිසුම

- ★ පෘතුගීසීන්ට කප්පම් ලෙස වසරකට ඇතුන් දෙදෙනකු ලබා දීම.
- ★ කලින් කෝට්ටේ රාජධානිය සතු ව පැවති සෑම ප්‍රදේශයක ම පෘතුගීසි රජතුමාගේ අධිපති බව උඩරට රජු විසින් පිළිගැනීම.

රජතුමා පෘතුගීසීන් සමග ගිවිසුමකට එළඹීම ගැන උඩරට වැසියා තම අප්‍රසාදය පළ කළහ. කෙසේ වුව ද මෙම ගිවිසුම ක්‍රියාත්මක වූයේ ද නැත.

## කොන්ස්තන්තීනු ද සාගේ උඩරට ආක්‍රමණය

1618 දී කපිතාන් ජනරාල් වශයෙන් පත් ව ආ කොන්ස්තන්තීනු ද සා උඩරට ආක්‍රමණය කිරීම ඉතා අවශ්‍ය කටයුත්තක් ලෙස පිළිගත් අතර ඒ සඳහා සූදානම් වීම පිණිස පියවර කිහිපයක් ගනු ලැබී ය.

1. පෘතුගීසීන් සතු ව පැවති බලකොටු ප්‍රතිසංස්කරණය කිරීම. ඒ අනුව,
   - ★ කොළඹ කොටුවට අලුත් තාප්පයක් බැඳීම හා එහි කාල තුවක්කු සවි කිරීම.
   - ★ ගාලු කොටුව හා මැණික් කඩවර කොටු අලුත්වැඩියා කිරීම.
2. අලුත් බලකොටු තැනීම.
   - ★ ක්‍රි. ව. 1623 ත්‍රිකුණාමලය සහ ක්‍රි. ව. 1628 මඩකලපුව බලකොටු ඉදිකරනු ලැබීම ය.
3. බෙරේ වැව අයිනේ වෙඩි බෙහෙත් කම්හලක් ඉදි කිරීම.
4. ක්‍රි. ව. 1625 දී වත්තල හා මෝදරට ආසන්න ව ජනපද පිහිටු වීම.
5. ලස්කිරිඤ්ඤ හමුද පෘතුගීසීන් අතහැර ගියහොත් අඹු දරුවන්ට දඬුවම් දීමට සූදනමක් ඇති බව දැක්වීම.

> ලස්කිරිඤ්ඤ හමුදව යනු පෘතුගීසීන් යටතේ කුලියට සේවය කළ ස්වදේශිකයන්ගෙන් යුක්ත හමුදව යි.

පෘතුගීසීන් බලකොටු ඉදි කිරීම ගැන උඩරට රජතුමා තම විරෝධය පළ කළ අතර රජතුමා ලන්දේසීන් සමග සාකච්ඡා කිරීම පිළිබඳ ව පෘතුගීසීහු තම විරෝධය පළ කළ හ.

## රන්දෙනිවෙල සටන

පහතරට ප්‍රදේශය මැනවින් සංවිධානය කර ගත් ද සා 1630 දී උඩරටට ආක්‍රමණයක් එල්ල කළේ ය. බදුල්ල නගරයට ආසන්න ප්‍රදේශයේ **"රන්දෙනිවෙල"** නම් ස්ථානයේ දී සෙනරත් රජතුමා හා ඔහුගේ පුත් මහා අස්ථාන කුමරු එක් ව කොන්ස්තන්තීනු ද සාගේ සේනාව සමූලඝාතනය කළේ ය. ද සා සටනේ දී මරණයට පත් විය.

## ගන්නෝරුව සටන

පෘතුගීසීහු 1638 දියෝගෝ ද මෙලෝ ද කස්ත්‍රෝගේ නායකත්වයෙන් උඩරට ආක්‍රමණය කළහ. **'ගන්නෝරුවේ'** දී ඇති වූ සටනින් පෘතුගීසීන් පරාජය ලැබූ අතර දියෝගෝ ද මෙලෝ කස්ත්‍රෝ පවා මරණයට පත් විය. මෙය පෘතුගීසීන්ගේ අවසන් උඩරට ආක්‍රමණය විය.

### ක්‍රියාකාරකම

1. පළමුවන විමලධර්මසූරිය රජතුමා 'උපායශීලී නිර්භීත රජතුමෙකි' උදාහරණ සපයමින් විස්තර කරන්න.
2. පෘතුගීසීන් උඩරට ආක්‍රමණය කිරීමට හේතු වූ කරුණු කවරේ ද?
3. 'ලස්කිරිඤ්ඤ හමුද' යනු කවුරුන් ද?
4. පහත සඳහන් වගුව ඔබේ අභ්‍යාස පොතේ පිටපත් කර ගෙන නිවැරදි ව පුරවන්න.

| වර්ෂය | පෘතුගීසි සෙන්පති | රජතුමා | සටනේ නම |
|---|---|---|---|
| | | පළමුවන විමලධර්මසූරිය | |
| | | | බලන |
| | කොන්ස්තන්තීනු ද සා | | |
| 1638 | | | |

## පෘතුගීසීන් යාපන රාජ්‍යය සමඟ පැවැත්වූ සම්බන්ධතා

ක්‍රි. ව. 1505 පෘතුගීසීන් ශ්‍රී ලංකාවට පැමිණෙන විට යාපනයේ පාලකයා ව සිටියේ පරරාජසේකරම් නමැත්තෙකි.

කුරුඳු, ගම්මිරිස් වැනි අගනා ද්‍රව්‍ය එහි නොවීම නිසා මුල් කාලයේ දී පෘතුගීසීන්ගේ අවධානය යාපනය කෙරෙහි යොමු නොවී ය. යාපන රාජ්‍යයේ අභ්‍යන්තර ආරවුල් නිසා පෘතුගීසීන්ට යාපනය කෙරෙහි සිත් යොමු කිරීමට අවස්ථාව උදා විය.

### පෘතුගීසීන් යාපනය කෙරෙහි සිත් යොමු කිරීමට හේතු

01. යාපනය හරහා ඉන්දියාව සමඟ සිදු කෙරෙන වෙළෙඳ කටයුතු බාධාවකින් තොර ව පවත්වා ගැනීම හා යාපන රාජ්‍යයේ සිටි හින්දු භක්තිකයන් අතර රෝමානු කතෝලික ආගම ව්‍යාප්ත කිරීම.

02. ක්‍රි. ව. 1519 දී සංකිලි නමැත්තා පරරාජසේකරම් රජු මරණයට පත් කොට යාපනයේ රජ බවට පත් වීම. එයින් බියට පත් පරරාජසේකරම්ගේ පුත්‍රයා පෘතුගීසීන්ගේ සහාය ඉල්ලා සිටීම.

මෙම අවස්ථාවෙන් ප්‍රයෝජන ගත් පෘතුගීසීහු සංකිලිට පහර දීම සඳහා ක්‍රි.ව. 1543 දී මාටින් අපොන්සු ද සූසා යටතේ විශාල හමුදවක් යාපනයට යැවූහ. සංකිලි උපායශීලි ලෙස පෘතුගීසීන් සමඟ ගිවිසුමක් ඇති කර ගත්තේ ය.

- ❋ ඒ අනුව වාර්ෂික ව පෘතුගීසීන්ට පර්දවෝ පන්සීයක් හා ඇතුන් දෙදෙනකු ලබාදීමට ද
- ❋ යාපනයේ කතෝලික ආගම ප්‍රචාරය කිරීමට අවසර ලබා දීමට ද සංකිලි රජු එකඟ විය.

තම බලාපොරොත්තු අපහසුවකින් තොර ව ඉටු වීම ගැන සතුටු වූ පෘතුගීසීහු ගිවිසුම ප්‍රකාර ව ධර්ම ප්‍රචාරය මන්නාරමින් ආරම්භ කළහ. යාපනය පුරා ඉතා ඉක්මනින් කතෝලික ආගම ව්‍යාප්ත කිරීමට සමත් වූහ. හින්දු පූජකවරු ඊට විරෝධය පළ කළ හ. එම තත්වය හමුවේ සංකිලි ද බියට පත් විය. එම නිසා සංකිලි රජු ද එම ආගම වැළඳගත් පිරිසට හින්දු ආගම අදහන ලෙස නියෝග කළ අතර, එය නොපිළිපදින අයට මරණ දඬුවම නියම කළේ ය.

## බ්‍රැගන්සාගේ යාපන ගමන

සංකිලිගේ එම ක්‍රියාවන්ට දඬුවම් කිරීම සඳහා ක්‍රි.ව. 1560 දී කොන්ස්තන්තීනු ද බ්‍රැගන්සාගේ නායකත්වය යටතේ, පෘතුගීසීහු යාපනය ආක්‍රමණය කළහ. නල්ලූර් නගරයට පැමිණි පෘතුගීසීන්ට විරුද්ධ ව යාපන වැසියෝ ප්‍රහාර එල්ල කළහ. සංකිලි රජ නල්ලූර් මාලිගය ගිනි තබා, කෝපායි වෙත පලා ගියේ ය. බ්‍රැගන්සා යාපනයේ වැසියන් මර්දනය කොට නල්ලූර් නගරය කොල්ලකා, එහි ප්‍රධාන කාර්යාලයක් පිහිටුවා ගැනීමට සමත් විය.

සංකිලි නැවත පෘතුගීසීන්ගෙන් තම රාජ්‍යය ලබා දෙන ලෙස ඉල්ලා සිටි අතර පොරොන්දු වූ පරිදි පරණ ගිවිසුම අඛණ්ඩ ව ක්‍රියාත්මක කරන බව ද, ඇපයක් ලෙස තම පුතු පෘතුගීසීන් වෙත රඳවන බව ද කියා සිටියේ ය. මෙම ඉල්ලීම පිළිගත් ගෝවේ ප්‍රතිරාජයා සංකිලිට නැවත රජකම ලබා දුන්නේ ය.

තම අනාගත සුරක්ෂිතතාව සඳහා පෘතුගීසීහු මන්නාරමේ බළකොටුවක් ඉදි කළ හ. සංකිලිගේ දරුණු ක්‍රියා කලාපයෙන් පීඩාවට පත් යාපන වැසියෝ අරගල කොට ඔහු සිංහාසනයෙන් නෙරපා දැමූහ.

- ★ අනතුරු ව බලයට පත් පෙරියපුල්ලේ හෙවත් චේගරාජ සේකරම්(ශෙගරාජසේකරම්) පෘතුගීසීන්ට දැඩි පක්ෂපාති බවක් දැක්වීම ගැන ජනතාව අකමැති වූහ. ජනතාව අරගල කොට ඔහු ද සිහසුනෙන් නෙරපා දැමූහ. මෙම අරගලයේ දී චේගරාජ සේකරම්ගේ පොඩි පුතා මැරීමට ගත් උත්සාහය පෘතුගීසි ජාතික පිඤ්ඤෝ විසින් වළකනු ලැබී ය. මෙම සිද්ධිය රත්නපුර මහ සමන් දේවාලයේ ගලක කොටා ඇති අයුරු ඔබට ද දැක බලාගත හැකි ය.
- ★ මෙම අරගලයෙන් පසුව බලයට පත් වූ සංකිලිගේ පුත්‍රයා වූ "පුවිරාජ පණ්ඩාරම්" පෘතුගීසි විරෝධි පිළිවෙතක් අනුගමනය කළේ ය. මෙතුමා මන්නාරමේ සිටි


නොමිලේ බෙදාහැරීම සඳහා ය.

පෘතුගීසීන් පලවා හැරීමට බලඇණියක් පිටත් කර හැරියේ ය.

★ පුවිරාජ පණ්ඩාරම්ගේ ක්‍රියා මැඬපැවැත්වීම සඳහා පර්නාදෝ මැන්ඩොන්සා යටතේ විශාල පිරිසක් මන්නාරම වෙත ළඟා වූහ. නල්ලූර්වලට පැමිණි මැන්ඩොන්සා පුවිරාජ පණ්ඩාරම් මරණයට පත් කළේ ය. අනතුරු ව ක්‍රි.ව. 1591 දී නල්ලූර් ගිවිසුම ඇති කර ගත්තේ ය.

★ ගිවිසුම අනුව යාපනයේ අසහාය නායකයා ලෙස පෘතුගාල රජතුමා පිළිගනු ලැබී ය.

★ පෙරියපුල්ලේගේ පුතා වන පරරාජසේකරම් හෙවත් හෙන්දර මානසිංහ පෘතුගාල රජතුමාගේ නාමයෙන් යාපනය පාලකයා බවට පත් විය. තමාව මරණයෙන් බේරා ගත් නිසාත්, තමාට යාපනයේ පාලක තනතුර ලබා දීම නිසාත් හෙන්දර මානසිංහ රජ පෘතුගීසීන්ට බොහෝ පක්ෂපාති විය.


රත්නපුර සමන්දේවාලයේ ඇති පින්තූරය

හෙන්දර මානසිංහ රජ ක්‍රි.ව. 1615 දී මිය ගිය අතර දෙවන සංකිලි බලයට පත් විය. පෘතුගීසීන්ට විරුද්ධ ව කටයුතු කිරීම ආරම්භ කළ මෙම රජ ද එතෙක් යාපනයේ රජවරුන් විසින් පෘතුගීසීන්ට ගෙවන ලද කප්පම් ගෙවීම පැහැර හැරියේ ය. තව ද ඔහු පෘතුගීසීන්ට විරුද්ධ ව ලන්දේසීන් සමඟ සාකච්ඡා පැවැත්වී ය.

## පෘතුගීසීන් යාපනය අත්පත් කර ගැනීම

සංකිලිගේ ද්‍රෝහි ක්‍රියා මැඬපැවැත්වීම සඳහා කුන්ස්තන්තීනු ද සා ප්‍රතිරාජයා විසින් පිලිප් ද ඔලිවේරා යටතේ බළසේනාවක් යාපනයට එවන ලදි. ක්‍රි. ව. 1619 දී සංකිලි අල්ලා ගෝවට පිටුවහල් කරන ලදි. එහි දී ඔහු මරා දමන ලදි. ඒ සමඟ යාපනය පෘතුගීසි යටත් ප්‍රදේශයක් බවට පත් විය. යාපනයේ කපිතාන්වරයා ලෙස පිලිප් ද ඔලිවේරා පත් විය.

### ක්‍රියාකාරකම

1. යාපනයේ රජ කළ රජවරුන්ගේ නම් ලැයිස්තුවක් සකස් කරන්න.
2. පෘතුගීසීන් යාපන රාජ්‍යය කෙරෙහි උනන්දුවක් දැක්වීමට තුඩු දුන් හේතු මොනවා ද?
3. ලංකා සිතියමක පහත සඳහන් ස්ථාන ලකුණු කරන්න.
   මන්නාරම, කෝපායි, නල්ලූර්, කයිට්ස්
4. "යාපන රාජ්‍යයේ පිරිහීමට හේතු වූයේ එම රාජ්‍යය තුළ පැවති අසමගිය යි." මීට පක්ෂ ව කරුණු දක්වන්න.

## පෘතුගීසීන් යටතේ ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල දේශපාලන, ආර්ථික, සාමාජික හා සංස්කෘතික කටයුතු

### පාලනය

පෘතුගීසීන් පැමිණෙන විට ලංකාවේ පැවතියේ රාජාණ්ඩු ක්‍රමයකි. අග්‍රරාජධානිය වූ කෝට්ටේ දිශා හතරකට බෙදා පාලනය කෙරිණි.

ක්‍රි.ව. 1597 දී මල්වානේ පැවති රැස්වීමේ දී ජේරනිමෝ ද අසවේදු විරාගත සිංහල සිරිත් විරිත් අනුව කෝට්ටේ රාජධානිය පාලනය කිරීමට එකඟ විය.

එකල ලංකාවේ පැවති පාලන ක්‍රමය තම පරමාර්ථ ඉටු කර ගැනීමට ප්‍රමාණවත් බව පෘතුගීසීන්ට පැහැදිලි විය. එහෙයින් එම දේශීය පාලන ක්‍රමය යටතේ ඔවුහු යටතට පත් වූ ප්‍රදේශවල ද පාලනය ගෙන ගියහ.




### පෘතුගීසි පාලනයේ විශේෂ ලක්ෂණ

1. ශ්‍රී ලංකාවේ පෘතුගීසි බලය පැවති මුහුදුබඩ ප්‍රදේශවල පාලන ක්‍රමය අනුව ඉහළින් ම සිටියේ පෘතුගාලයේ රජු ය. ඔහුගේ අණ ක්‍රියාත්මක කිරීමට පෙරදිග මධ්‍යස්ථානයක් පවත්වා ගත් අතර එය ඉන්දියාවේ ගෝවේ පිහිටුවා තිබිණි. එහි සිටි පාලකයා ප්‍රතිරාජයා (විසුරෝ) ලෙස හැඳින්වුණු අතර ඔහු යටතේ ශ්‍රී ලංකාවේ පෘතුගීසි ප්‍රදේශ පාලනය කිරීම සඳහා කපිතාන් ජනරාල්වරයෙක් පත් කර එවනු ලැබී ය. ඒ අනුව ශ්‍රී ලංකාවේ පෘතුගීසි බලය පැවති ප්‍රදේශවල ප්‍රධානයා වූයේ කපිතාන් ජනරාල්වරයා ය. ඔහුගේ සහාය පිණිස නිලධාරී පිරිසක් වූහ.
2. කපිතාන් ජනරාල් යටතේ පැවති ප්‍රදේශ දේශීය (රාජාණ්ඩු ක්‍රමය යටතේ පැවති) ක්‍රමයට ම ප්‍රාදේශීය පාලන ඒකකවලට බෙදා ඒවා භාර ව නිලධාරීහු පත් කොට සිටියහ.
3. විකාර් ජනරාල් නමින් හැඳින්වුණු පූජකතුමා ආගමික කටයුතු මෙහෙයවී ය.
4. "ශාන්ත ලොරන්ස් නගරය" යන නමින් හැඳින්වූ **කොළොම්පුරය** නාගරික සභාවක් මගින් පාලනය විය.


නොමිලේ බෙදාහැරීම සඳහා ය.




| | | |
|---|---|---|
| දිසාවනිය | - | දිසාවේ |
| රට | - | රටේ මහත්තයා |
| කෝරල | - | කෝරාල |
| පත්තු | - | අතුකෝරාල |
| ගම් | - | ගම්මුලාදෑනි |

## වෙළෙඳාම

පෙරදිගට පැමිණීමේ ප්‍රධාන පරමාර්ථය වන වෙළෙඳම අත්පත් කරගැනීමට පෘතුගීසීහු අපමණ වෙහෙසක් දැරූහ.

- ★ කුරුඳු වෙළෙඳම සම්පූර්ණයෙන් ම පෘතුගීසි ආණ්ඩුව වෙත පවරා ගනු ලැබී ය. කුරුඳු එකතු කිරීම භාර ව වෙන ම දෙපාර්තමේන්තුවක් පිහිට වූ අතර එය මහබද්ද ලෙස හැඳින්විණි. එහි ප්‍රධානියා මහබද්දේ කපිතාන් නම් විය.
- ★ පුවක් හා ගම්මිරිස් විකිණිය හැකි වූයේ පෘතුගීසි ආණ්ඩුවට පමණි.
- ★ දේශීය ජනතාව සතු ව පැවති ඇතුන් හා මැණික් පිටරට යැවීමේ ඒකාධිකාරය පෘතුගීසි ආණ්ඩුව සතු විය. පෘතුගීසීන්ට ශ්‍රී ලංකාවේ දී වෙළෙඳ කටයුතුවලින් ඉමහත් ලාභ ලබා ගැනීමට හැකි විය.

## කතෝලික ආගම

ශ්‍රී ලංකාවේ කතෝලික දහම පතුරුවා හැරීමට පෘතුගීසීහු මහත් වෙහෙසක් දැරූ හ.

1. ක්‍රි.ව. 1543 දී ධර්මපාල කුමරුගේ පිළිරුව ලිස්බන්හි දී ඔටුනු පැළඳවීම සඳහා ගිය දූත පිරිස පෙරළා එන ගමනේ දී ෆැන්සිස්කානු පූජකවරු හතර දෙනකු පැමිණීම කතෝලික දහම ශ්‍රී ලංකාවේ ව්‍යාප්ත කිරීමේ මුල් පියවර විය. 7 වන බුවනෙකබාහු රජතුමාගේ ඉල්ලීම පිට පැමිණි මෙම පූජක පිරිස රජතුමාගේ අනුදැනුම ඇති ව සැරිසරමින් මුහුදුබඩ පළාත්වල කිතු දහම ව්‍යාප්ත කළහ.
2. අනතුරු ව පැමිණි ඩොමිනිකන් හා ජේසුයිට් පූජකවරුන්ගේ උත්සාහය සමග තවදුරටත් ධර්ම ප්‍රචාරය ව්‍යාප්ත වූ අතර වෙරළබඩ ප්‍රදේශවල දේවස්ථාන රාශියක් ඉදි කරනු ලැබී ය.
3. ක්‍රි.ව. 1557 ධර්මපාල රජතුමා බෞතීස්ම ලැබීමත් සමඟ එතුමාට පක්ෂපාතී ප්‍රභූවරු විශාල පිරිසක් කිතුදහම වැලඳ ගත්හ.
4. ධර්මපාල රජතුමා බෞද්ධ හා හින්දු කෝවිල් සතු දේපළ කතෝලික පල්ලියට පවරා දුන් අතර පූජකවරුන්ට යැපීමට ප්‍රමාණවත් ඉඩකඩම් ද ලබා දීමෙන් අනුග්‍රහය දැක්වී ය.
5. යාපනයේ පාලකයන්ගේ ද සහයෝගයෙන් යාපනය පුරා කතෝලික දහම ව්‍යාප්ත කෙරිණි.
6. මිෂනාරිවරුන්ගේ නොපසුබස්නා උත්සාහය ද කතෝලික දහම ව්‍යාප්ත වීමට හේතු විය. ඔවුන් ඉතා කෙටි කාලයක දී සිංහල හා දෙමළ භාෂා ඉගෙනගෙන ගම් වැසියන් හා එක් ව හැසිරෙමින් ලෙඩින් දුකින් පෙළුණු අයට සාත්තු සප්පායම් කරමින් ඔවුන්ගේ සිත් දිනා ගැනීම ද කතෝලික දහම ව්‍යාප්ත කිරීමට මහත් රුකුලක් විය.
7. කතෝලික දහම වැලඳ ගත් අයට රජයේ තනතුරු (තාන්නමාන්න) ගරුනම්බු නාම ලබා දීම සහ බදු සහන සැලසීම ද කතෝලික දහම ව්‍යාප්ත වීමට හේතු විය. කතෝලික ආගම වැලඳ ගත් අයගෙන් මරාල බද්ද අය නොකිරීම නිදසුනකි.
8. කතෝලික දහම වැලඳ ගත් අයට කුල භේද නොසලකා සමාජයේ උසස් තනතුරු තාන්නමාන්න ලබා ගැනීමට හැකි වීම නිසා මෙම වාසි අපේක්ෂාවෙන් සමහරු කිතුදහම වැලඳ ගත්හ.
9. කතෝලික ආගමට බද්ධ ව පැවති උත්සව ජනතාවගේ සිත් ඇදගැනීමට හේතු විය.
10. අධ්‍යාපනය ලබා දුන් පැරිස් පාසල් මගින් කතෝලික ආගම ව්‍යාප්ත කරනු ලැබී ය.

පෘතුගීසීන් ශ්‍රී ලංකාවෙන් බැහැර ව යන විට බොහෝ ප්‍රදේශවල කතෝලික දහම ව්‍යාප්ත ව පැවතිණි.

## අධ්‍යාපනය

පල්ලියට යාබද ව පිහිටවනු ලැබූ පැරිස් පාසල්වල දේවධර්මයට අමතර ව අංක ගණිතය, ලතින් භාෂාව, සංගීතය වැනි විෂයයන් ඉගැන්විණි. එම පාසල්වල ස්වභාෂාවෙන් අධ්‍යාපනය ලබා දෙන ලදි. ශිෂ්‍ය සංඛ්‍යාව හා ගුරුවරු සංඛ්‍යාව ශීඝ්‍රයෙන් වැඩි වූ අතර ගුරුවරුන් පුහුණු කිරීමට අභ්‍යාස ආයතනයක් ද පිහිටුවන ලදි.

## ආරෝග්‍යශාලා

අපරදිග වෛද්‍ය ක්‍රමය අනුව ප්‍රතිකාර කිරීම සිදු විය. රෝගීන්ට සාත්තු කිරීම පුහුණු කිරීම සඳහා ක්‍රි.ව. 1552 කුඩා ආරෝග්‍ය ශාලාවක් ආරම්භ කළ අතර එය " එස් පිරිටල්" නමින් හැඳින්විණි. ස්ප්‍රිරිතාලය යන නාමය ඉන් බිඳී ආවක් ලෙස සැලකේ. ද ඔලිවේරා යටතේ යාපනයේ ද ජූසේවාස් පියතුමා යටතේ මන්නාරමේ ද ඉදි වූ ආරෝග්‍යශාලා වැඩි වශයෙන් සෙබළුන්ගේ ප්‍රයෝජනය සඳහා භාවිත විය.

## මීසරි කෝඩියා (මඩම)

මෙය දේවස්ථාන හා සම්බන්ධ සමාජ සේවා ආයතනයක් ලෙස හැඳින්විය හැකි ය. නැති බැරි අය රැකබලා ගැනීම, අනාථයන්ට ඉගැන්වීම, මළවුන් වළදැමීම මඩම මගින් සිදු කළ කාර්යයන් විය. කොළඹ, ගාල්ල, මන්නාරම, යාපනය යන ස්ථානවල "මඩම්" දක්නට තිබිණි.

## සාහිත්‍යය

යම් කතා ප්‍රවෘත්තියක් නාට්‍යානුසාරයෙන් ගෙන හැර දැක්වීම සිදු කළ අතර ජනතාවගේ සිත් සතන් ඇදගැනීමටත් ඔවුන් තුළ දේව භක්තිය ඇතිකිරීමටත් මෙම නාට්‍ය උපකාරී විය.

- ★ තව ද දේවධර්මය පිළිබඳ ව දෙමළ බසින් ද ග්‍රන්ථ රචනා කොට ඇත. කොන්ස්තන්තීනු ද සාගේ සටන ගැන මහත් වර්ණනාවක් ඉදිරිපත් කරන අලගියවන්න මුකවෙටිතුමා, පෘතුගීසීන් වෙතින් සාහිත්‍යය හදාළ පුද්ගලයකු සේ සැලකේ.

- ★ සාහිත්‍ය ක්ෂේත්‍රයේ සංගීතය කැපීපෙනුණ අංගයක් විය. වර්තමානයේ පවා ජනප්‍රිය ව පවතින බයිලා හා කපිරිඤ්ඤා ඒ අතර ප්‍රධාන වේ.

> විවාහ ලියාපදිංචි කිරීම මගින් පවුල් ජීවිතය නීත්‍යානුකූල තත්ත්වයකට පත් කරනු ලැබී ය. තෝම්බු සම්පාදනය මගින් ඉඩම් පිළිබඳ ව තොරතුරු රැස්කිරීම ද පෘතුගීසින් කළ තවත් කාර්යයකි.

| පෘතුගීසීන් පැමිණීම නිසා ඇති වූ තවත් බලපෑම් රාශියක් වගුව ඇසුරින් හඳුරන්න. | | |
|---|---|---|
| ඇඳුම් | - | කමිස, සාය, කබාකුරුත්තු, කලිසම |
| ආහාර | - | පාන්, වයින්, සලාද, අච්චාරු, පස්තෑල |
| පුද්ගලික හා පෙළපත් නාම | - | කැතරින්, ජෝන්, සිල්වා, පෙරේරා, මෙන්ඩිස්, ද වාස්, අල්මේද |
| කලාව | - | ගෘහ නිර්මාණ, ප්‍රතිමා කලාව, චිත්‍ර |
| ගීත | - | බයිලා, කපිරිඤ්ඤ |

ක්‍රි.පූ. 1505 දී ශ්‍රී ලංකාවට පැමිණි පෘතුගීසීහු මුහුදුබඩ ප්‍රදේශ යටත් කොට ගෙන ක්‍රි. ව. 1658 දක්වා ඒවා පාලනය කළහ. උඩරට රජු හා ලන්දේසීහු එකතු වී ඔවුන් මෙරටින් පලවා හැර දැමූහ. එම කාල පරිච්ඡේදය ශ්‍රී ලංකා ඉතිහාසයේ සන්ධිස්ථානයක් ලෙස සැලකේ.

**ක්‍රියාකාරකම**

පෘතුගීසි පාලනයේ ප්‍රතිඵල දැක්වීම සඳහා හැකුලුම්පතක් සකස් කරන්න.

## සාරාංශය

**පෘතුගීසීන් ශ්‍රී ලංකාවට පැමිණීම යන පරිච්ඡේදය ඔස්සේ පහත සඳහන් තොරතුරු ගොනු කර ගැනීමට ඔබ සමත් වී දැ යි බලන්න.**

**බටහිර ජාතීන් පෙරදිගට තම අවධානය යොමු කිරීම, පෘතුගීසීන් 1505 දී ශ්‍රී ලංකාවට පැමිණීම, එවකට අග්‍ර රාජධානිය ලෙස පැවැති කෝට්ටේ රාජධානිය සමග සබඳතා ඇති කර ගැනීම, අනතුරු ව ධර්මපාල රජතුමාගේ අභාවයත් සමග කෝට්ටේ රාජධානිය හිමි කර ගැනීම, අපමණ වෙහෙස දරමින් කන්ද උඩරට අල්ලා ගැනීමට උත්සාහ ගත්ත ද පෘතුගීසීන් ඊට අසමත් වීම, 1658 දී පෘතුගීසීන්ට මෙරටින් බැහැර ව යෑමට සිදු වීම, එසේ වුව ද ඔවුන් ඉතිරි කර ගිය පියසටහන්, අද දක්වා ම ශ්‍රී ලංකා සමාජය තුළ දේශපාලන, ආර්ථික, සාමාජික, සංස්කෘතික හා භාෂා යන සෑම අංශයකින් ම දක්නට ලැබීම.**

**මෙම කාල පරිච්ඡේදය පිළිබඳ ව ලියවුණු පොත පත කියවා තව දුරටත් තොරතුරු රැස් කර ගන්න.**



නොමිලේ බෙදාහැරීම සඳහා ය.